සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, සයවැනි කලාපය, පිටු 175-191
ISSN 1800-1459

# චීනයේ ලාඕසතුමා හා එතුමාගේ ඉගැන්වීම්වලට බලපෑ සමාජ දාර්ශනික පසුබිම පිළිබඳ විමසීමක්

මැදවච්චියේ ධම්මජෝති හිමි

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

**සාරාංශය**

ලාඕසතුමා තම දර්ශනය ගොඩනැගීමේදී පදනම් කරගත් හේතු සාධක රාශියක් පෙන්වා දිය හැකිය. ලාඕසතුමාට පෙර හා සමකාලීන චීනයේ පැවති විවිධ දාර්ශනික ගුරුකුලවල ආභාසය එතුමාට ලැබෙන්නට ඇති බව කල්පනා කළ හැකි ය. එම ගුරු කුල අතර කොන්ෆියුසියස් හා කොන්ෆියුසියස්ගේ ඉගැන්වීම් හැඳින්වෙන 'Rujia' 'රූජියා' නම් සම්ප්‍රදායේ බලපෑම ලාඕසට ලැබෙන්නට ඇති බව විචාරකයන්ගේ අදහසකි. මෙම ආචාර්යවරුන් දෙදෙනා සමකාලීනයන් වූ බැවින් ඔවුන් දෙදෙනාට ම තම තමන්ගේ අදහස් වලට එකිනෙකාගේ ආභාෂය ලැබෙන්නට ඇතැයි කල්පණා කළ හැකිය. විශේෂයෙන්ම සාම්ප්‍රදායික චීන දාර්ශනික ගුරුකුලවල ඉගැන්වීම් කොන්ෆියුසියස් හා ලාඕස ආචාර්යවරුන්ට තම දාර්ශනික චින්තාවන් ගොඩ නැගීමේ දී උපකාරී වී ඇත. තම දර්ශනයන් ගොඩනැගීමේ දී කොන්ෆියසියස්තුමාට මෙන් ම ලාඕසතුමාට ඔවුන් ජීවත් වූ සමකාලීන සමාජ වටපිටාව හා අත්දැකීම් පසුබිම් වූ බව සිතිය හැකි ය. මෙම දාර්ශනිකයන් දෙපොල ජීවත් වූ ක්‍රි. පූ. 6 වන සියවසේ චීනය තුළ ආර්ථික දේශපාලන හා සාමාජික යන සෑම ක්ෂේත්‍රයක ම ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වී තිබුණි. ඊට ප්‍රධාන ම හේතුව වී තිබුණේ අභ්‍යන්තර සිවිල් යුධ කෝලාහලයන් ය. යුද්ධය නිසා වැනසී යන සමාජ සදාචාරය ගොඩනැගීම කාලීන අවශ්‍යතාවක්ව පැවතුණි. එය සපුරාලනු වස් කොන්ෆියුසියස් හා ලාඕස යන චීන ආචාර්යවරුන් දෙපොල තම චින්තනයන් ඉදිරිපත් කළහ. ලාඕසතුමා 'දාඕ ' හා 'ද ' යන සංකල්ප දෙක පදනම් කොටගෙන තම දාර්ශනික චින්තනය හා සමාජ දර්ශනය ඉදිරිපත් කරයි.

**කේන්ද්‍රීය වචනඃ** ලාඕස, දාඕ, ද, දාඕදජින්ග්, තැය්ජි.

## හැඳින්වීම

චීනයේ පෞරාණික ඉගැන්වීම් (ආගම්) තුනකි. ඒවා නම් කොන්ෆියුසියස්, 'දාඕ' හා බුදු දහම වේ. චීනයේ කොන්ෆියුසියස් හා 'දාඕ' දහමේ නිර්මාතෘවරයා වශයෙන් සැළකෙන ලාඕස මෙන් ම ඉන්දියාවේ ගෞතම බුදුරජාණන් වහන්සේ යන තිදෙනාම ක්‍රි.පූ. 6 වන සියවසේ විසූ සමකාලීන ශාස්තෲවරුන් වශයෙන් සැලකුණත් චීනයට බුදු දහම සම්ප්‍රාප්ත වන්නේ ක්‍රි.ව. පළමුවන සියවසේ (67) පමණ ය. ඒ වන විට චීන සංස්කෘතිය කොන්ෆියුසියස් හා 'දාඕ' ඉගැන්වීම්වලින් පරිපෝෂිත වී තිබුණි. කොන්ෆියුසියස් දහම පාරභෞතික සංකල්පවලින් වියුක්තව පුද්ගල හා සමාජ වගකීම් මත පදනම් වූ පෘථුල සමාජ දර්ශනයක් වශයෙන් හඳුන්වා දිය හැකි ය. ආරම්භයේ දී 'දාඕ' දහම ද දාර්ශනික සම්ප්‍රදායයක් වශයෙන් ගොඩනැගුණත් (Daojia) පශ්චාත්කාලීන ව එය ආගමික ව්‍යාපාරයක් බවට පරිවර්තනය වේ. මේ නිසා බුදු දහමේ මෙන්ම 'දාඕ' දහමේද 'දාඕ' ආගමික සිද්ධස්ථාන, 'දාඕ' පූජකයන්, 'දාඕ' ආගමික උත්සව හා 'දාඕ' අභිචාර ක්‍රම වර්තමාන චීනයේ සජීවමානව දැක ගත හැකිය. සමහර විට මෙය බුදු දහමේ ආභාෂයෙන් සිදු වූවක් විය හැකිය.

## සාහිත්‍ය විමර්ශනය

ලාඕස හා එතුමාගේ ඉගැන්වීම් ගවේෂණය කිරීමේදී ඉතාමත් වැදගත් ම මූලාශ්‍රය වන්නේ එතුමා විසින් ම ප්‍රකාශ කරන ලද කියමන් එකතු කොට රචනා කරන ලද දාඕදජින්ග් කෘතියයි. එම කෘතියේ අන්තර්ගතයන් අධ්‍යයනය කිරීම හා ඒ මගින් පර්යේෂණයට අදාළ ප්‍රකාශයන් ඉදිරිපත් කෙරේ. එසේම ලාඕසතුමාගේ සමකාලීනයෙකු වූ කොන්ෆියුසියස්ගේ ප්‍රධානතම කෘතිය වන *ලුන්යු* නම් මූලාශ්‍රය ද මෙහිදී නිරීක්ෂණය කෙරේ. ඊට හේතුව එම කෘතියේ හා ලාඕසගේ දාඕදජින්ග්හි සාම්‍යයන් විද්‍යමාන වීමයි. මීට අමතර ව ලාඕසගේ ශිෂ්‍යයෙකු වූ වන්ග් බී. නම් ආචාර්යවරයා තම ගුරුවරයා ගේ කියමන් එසේත් නැතිනම් *දාඕදජින්ග්* ග්‍රන්ථයෙහි අන්තර්ගතයන් පිළිබඳ ඉදිරිපත් කරන විචාරයන් ද අවශ්‍ය තැන්හි උපයෝගී කරගනු ලැබේ. එසේ ම චීනයේ ප්‍රධාන ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන් සැලකෙන සිමා චියැන් විසින් රචිත *සජි (Shiji) (The Historical Records)*යන කෘතිය ද වැදගත් වෙයි.

මෙබඳු පෞරාණික මුල් මූලාශ්‍රය හැරුණු විට මෙම විෂය පිළිබඳ නූතන ආචාර්යවරුන් විසින් පර්යේෂණාත්මක ව රචනා කරන ලද ද්විතීක මූලාශ්‍රය ද බොහෝය. ඒවා අතර වන් ගු ඉන්ග් විසින් චීන බසින් රචනා කරන ලද *ලාඕස පින්ග් චුවැන් (Laoshi Pingchuang)* වන්ග් මින්ග් විසින් චීන බසින් රචනා කරන ලද *දාඕජියා හ දාඕජියා සක්ෂයන්ග් යැන්ජියෝ ( Daojia he Daojia Sixiang Yang jiu)* එසේම ඉංග්‍රීසි බසින් රෙන් ජියු විසින් රචනා කරන ලද *A Taoism as an Indigenous Chinese Religion,* වන්ග් කේ පින්ග් විසින් රචිත *The Classic of the Dao - A New Investigation* යනාදී කෘති ද අවශ්‍ය පරිදි උපයෝගී කර ගැනේ.

## පර්යේෂණ ගැටලුව

ලාඕසගේ දාර්ශනික චින්තනය ගවේෂණය කිරීමේදී චීන විචාරකයන් විසින් මතු කරන ලද ප්‍රධාන ගැටලුව නම් එතුමා තම දර්ශනය ගොඩනැගීම සඳහා කුමන සාධක උපයෝගී කර ගෙන තිබේ ද? යන්නයි. එහිදී තම සමකාලීනයෙකු වූ කොන්ෆියුසියස්තුමාගේ ඉගැන්වීම්වල ආභාසය ලබන්නට ඇති බවට එක් මතයක් වශයෙන් ඉදිරිපත් කෙරේ. අනෙක් අදහස නම් ලාඕසතුමාට සහ කොන්ෆියුසියස්ට බලපාන ලද්දේ තමන්ට පෙර පැවති විවිධ දාර්ශනික ගුරුකුලවල ඉගැන්වීම් බවයි. එසේම මෙම ආචාර්යවරුන් දෙපොල ම තමන් ජීවත් වූ ක්‍රි. පූ. 6 වන සියවසේ චීනයේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිම තම ඉගැන්වීම් සඳහා පදනම් කරගත් බව තවත් මතයකි.

## පර්යේෂණ අරමුණු

ලාඕසතුමාගේ ඉගැන්වීම්වලට බලපෑ කරුණු කාරණා පර්යේෂණය කිරීම කේන්ද්‍ර කොටගෙන එතුමාගේ ඉගැන්වීම් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ලිපියේ ප්‍රධාන පර්යේෂණ අරමුණ යි.

## පර්යේෂණයේ වැදගත්කම

ලාඕසතුමා පමණක් නොව චීන දාර්ශනික ඉගැන්වීම් පිළිබඳ සිංහල භාෂාවෙන් සිදු වී ඇති පර්යේෂණ ඉතාමත් අල්ප ය. චීන දර්ශනය හා චීන සමාජය පිළිබඳ

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යයන සිදු වුවත් සිංහල භාෂාවෙන් ඒවා හදාරණ විද්‍යාර්ථීන්ට ඇති පර්යේෂණාත්මක ලිපි ලේඛන ඉතාමත් දුර්ලභ ය. මෙම ලිපියෙන් ලාඕස, එතුමාගේ *දාඕදජින්ග්* ග්‍රන්ථය හා එම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කෙරෙන දාර්ශනික චින්තනයන් හා ඒවාට බලපෑ සමාජ හා දාර්ශනික පසුබිම ආදිය සාකච්ඡා කෙරේ.

මෙම නූතන විචාරයන්හි දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ ඒවා එක් එක් අන්තවල සිට කරුණු ඉදිරිපත් කිරීමයි. උදාහරණ වශයෙන්, ලියො පන් විසින් චීන බසින් රචිත ලාඕ අන් විසින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන ලද *Daoism as an Indigenous Chinese Religion* නම් කෘතියේ කොන්ෆියුසියස්තුමාට ලාඕසගේ ඉගැන්වීම් වල ආභාසය ලැබුණු බව දක්වන නව මතය පෙන්වා දිය හැකි ය. එය චීනයේ සාම්ප්‍රදායික පිළිගත් කොන්ෆියුසියස්ගේ ඉගැන්වීම් ලාඕසට බලපෑ බවට ඉදිරිපත් කෙරෙන මතයට සම්පූර්ණයෙන් ම ප්‍රතිපක්ෂ වේ. එසේ ම ලාඕසතුමා කිසිදු සාම්ප්‍රදායික දර්ශනයක ආභාසය නොලබා ස්වාධීන ව තම චින්තනය ගොඩනැගූ බව තවත් එක් විචාරක මතයකි. තව ද එතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉගැන්වීම් සමකාලීන සමාජ හා දාර්ශනික පසුබිම පෝෂණය කිරීමට ඉවහල් වූ අයුරු සාකච්ඡා කෙරෙන අතර එකී සමාජ හා දාර්ශනික පසුබිම එතුමාගේ චින්තනය සකස් කර ගැනීම සඳහා කොතරම් දුරට බලපෑවේ ද යන්න සාකච්ඡා කෙරෙනුයේ ඉතාමත් මඳ වශයෙනි. එමනිසා මෙම ලිපියේ මුඛ්‍යතම අරමුණ වන්නේ ලාඕස හා එතුමාගේ ඉගැන්වීම් වල ස්වරූපය ඉදිරිපත් කරමින් ඒ සඳහා බල පෑ විවිධ කරුණු කාරණා අදාළ සාහිත්‍යමය මූලාශ්‍රය පර්යේෂණය කොට ඉදිරිපත් කිරීමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ලාඕස හා එතුමාගේ ඉගැන්වීම් අධ්‍යයනය සඳහා වැදගත් වන මූලාශ්‍රය වර්ග රාශියකි. ඒවා අතර සාහිත්‍යය, ශිලාලේඛන හා ජනශ්‍රැති ආදිය ප්‍රමුඛවේ. මෙම පර්යේෂණය සඳහා සම්පූර්ණයෙන් ම පාදක කරගනු ලබනුයේ සාහිත්‍යමය මූලාශ්‍රය පමණි. එම නිසා මෙය සාහිත්‍යමය මූලාශ්‍රමය පදනම් කරගෙන කෙරෙන පර්යේෂණයකි.

## සාකච්ඡාව

### ලාඕසතුමා

චීනයේ ලාඕස නම් ආචාර්යවරයා සම්බන්ධ මතවාද දෙකක් තිබේ. එනම්

I. ලාඕස ක්‍රි.පූ. 770-476 අතර චීන ඉතිහාසයේ 'වසන්ත හා සරත්' නමින් හැඳින්වෙන වකවානුවේ පශ්චාත් භාගයේ කොන්ෆියුසියස් ආචාර්යවරයාට සමකාලීනව විසූ දාර්ශනිකයෙකි.

II. ලාඕස කොන්ෆියුසියස්ට පසුව යුද්ධ රාජ්‍ය සමයේ එනම් ක්‍රි.පූ. 475-221 කාලයේ විසූවෙකි.

ක්‍රි.පූ. 145-86 අතර විසූ චීන ඉතිහාසඥයෙක් වූ සිමා චියැන්ගේ ඓතිහාසික වාර්තා (*Shiji = The Historical Records*) නම් ග්‍රන්ථයේ දක්වෙන ලාඕස ආචාර්යවරයාගේ චරිතාපදානයේ එතුමා අයත් කෙරෙන්නේ ඉහත දක්වූ මුල් වකවානුවටය (Wang Keping 1998: 2). එනම් ලාඕස ෂු රාජ්‍යයේ කුක්ෂියැන් දිස්ත්‍රික්කයේ චුරෙන්ලි නම් ග්‍රාමයේ ලී ක්ෂියන්ග් නම් ජන වර්ගයට අයත් වූවෙක් බවයි. එතුමාගේ පෙළපත් නාමය ලී නම් විය. එතුමාට දෙන ලද නාමය දන් නම් විය. ක්‍රි.පූ. 770-256 අතර කාලයේ එතුමා ජාතික පුස්තකාලයේ සේවය කළේය. එය වර්තමාන චීනයේ හර්නන් පළාතේ ලෝයන්ග් නගරයට අයත් ප්‍රදේශයේ පිහිටා තිබෙන්නට ඇතැයි සැළකේ. කොන්ෆියුසියස්තුමා එහි ගොස් ලාඕස හමු වූ බවත් එසේම කොන්ෆියුසියස්තුමා විසින් ලාඕස ආචාර්යවරයාගෙන් ආචාරධර්ම .(ලී = li) යනු කුමක්දැයි විමසූ බවත් දක්වේ. ලී (li) යන පදය ඉංග්‍රීසියට principle හා rights යන පදවලින් පරිවර්තනය කර තිබේ. එය සිංහලට 'ප්‍රතිපත්ති', 'නියමය', 'ධර්මය' ආදී වශයෙන් පරිවර්තනය කර ගත හැකිය. කොන්ෆියුසියස් දහමේ ල හා රි (li and ri) යුතුකම් හා උත්සව ප්‍රධානම ඉගැන්වීමකි.

එම අවස්ථාවේ දී ලාඕස තම යහපත සඳහා අධික ආඩම්බරය, තෘෂ්ණාව හා උද්ධච්ඡකම අත්හරින ලෙස කොන්ෆියුසියස්ගෙන් ඉල්ලා සිටි බව දක්වේ. එකල රාජ්‍ය පෙළපතේ පරිහානිය දුටු ලාඕස තමන් කලක් ජීවත්ව සිටි නගරයෙන් හා සේවා ස්ථානයෙන් අස්වී චීනයේ බටහිර දෙසට ගමන් කරයි. එහි දී හාන්ගු ගුවාන් නම් ස්ථානයේ දී ගුවන්ඉ නම් පුද්ගලයා විසින් එතුමාව සතුටින් පිළිගෙන සංග්‍රහ කොට එතුමා ශාන්තුවරයෙකු වීමට යන බැවින් තමන් වෙනුවෙන් ග්‍රන්ථයක් රචනා කර දෙන මෙන් ඉල්ලා සිටි බවත් එහි දී ලාඕස විසින් කොටස් දෙකකින් යුක්ත ව චීන වචන පන්දාහකට අධික වන සේ 'දාඕ' හා 'ද' පිළිබඳ ග්‍රන්ථයක් රචනා කරන ලද බවත් සීමා චියැන් තව දුරටත් වාර්තා කරයි. එම ග්‍රන්ථය *දාඕදජින්ග්* නමින් ප්‍රකට විය. ඉන් පසු චීනයේ බටහිර දෙසට ගමන් කළ එතුමා පිළිබඳ කිසිවක් වාර්තා නොවේ. එතුමා අන්තිම කාලයේ ගිහි මහත්මා ශාන්තුවරයෙක් වූ බවට පිළිගැනේ.

ලාඕස සම්බන්ධ දෙවන මතය ද එනම් එතුමා කොන්ෆියුසියස්ට වසර 129 කට පසුව විසූවෙකු වශයෙන් පිළිගැනීම ද සිමා චියැන් ඉතිහාසඥයා තම ග්‍රන්ථයේ වාර්තා කර තිබේ. චින් රාජ්‍යයේ (ක්‍රි.පූ. 384-362) විසූ ඩුකේක්ෂියැන්ග සමග චෝ රාජ්‍යයේ විසූ දන් සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වූ බව දක්වේ. මෙහි එන දන ලාඕස වශයෙන් සමහරු කල්පනා කරති. කෙසේ නමුත් ලාඕස හා කොන්ෆියුසියස් සමකාලීනයන් වූ බවට තිබෙන වාර්තා ඉතාමත් ප්‍රබල ය. කොන්ෆියුසියස්තුමා බටහිර චෝ රාජ්‍යයට ගොස් ආචාරධර්ම (li) පිළිබඳ ව ලාඕස නම් ආචාර්යවරයාගෙන් විමසූ බව සිමා චියැන් ඉදිරිපත් කරන කොන්ෆියුසියස් අපදානයෙන් ද තහවුරු කෙරේ. කොන්ෆියුසියස්තුමා තම ලු රාජ්‍යයට ආපසු පැමිණි පසු එතුමාගේ සමීපතම ශිෂ්‍යයෝ මෙකී ආචාරධර්ම (li) එතුමාගෙන් දැන උගත්හ. ඒ බව කොන්ෆියුසියස්ගේ සම්භාව්‍ය ග්‍රන්ථ පහෙන් එකක් වන (*Liji*) *The Book of Rites* - ආචාරධර්ම පිළිබඳ ග්‍රන්ථයේ මැනවින් වාර්තා වේ. එසේම එහි කොන්ෆියුසියස්තුමා තම ශිෂ්‍ය ත්සංසට ලාඕස විසින් අනුගමනය කරන ලද ආචාරධර්ම (li=ලී) ප්‍රකාශ කළ බව ද වාර්තා වේ. ලාඕසගේ නම එම ඡේදය තුළ හත් වතාවක් සඳහන් වේ. තවද ක්‍රි.පූ. 369-286 අතර විසූ

ක්‍ෂුවංස තම ග්‍රන්ථයේ (Zhuangzi) ලාඕස හා නගර පිළිබඳ දාසය වතාවක් පමණ සඳහන් කරන අතර එයින් බාගයක්ම ලාඕස හා කොන්ෆියුසියස් අතර සම්බන්ධතාවන් ය. කොන්ෆියුසියස්තුමා ලාඕසගෙන් ආචාරධර්ම පිළිබඳ ඉගෙනගත් බවට සමාන ප්‍රකාශ *ලූෂි ෂුවන් චියෝ (LüShi Chuan Qiu)* නම් ග්‍රන්ථයේ (ක්‍රි.පූ 235) ද වර්තමාන සන්ඩොන්ග් පළාතේ තිබෙන කොන්ෆියුසියස්ගේ උපන් ගම වන ක්‍රුංෆුහි පිහිටුවා තිබෙන කොන්ෆියුසියස් ආරාමයේ ගඩොල් කැටයම්වල ද මැනමින් මූර්තිමත් කර තිබේ. කොන්ෆියුසියස් ලාඕසගෙන් ආභාසය ලැබූ බව සිතිය හැකි සඳහන් කොන්ෆියුසියස්ගේ ප්‍රධානම ග්‍රන්ථය වන (*Lun yu*) *The Analects of Confucius* හි සඳහන් රාශියක් වේ. ඒවා ලාඕසගේ *දාඕදජින්ග්හි* එන ප්‍රකාශවලට සමාන වේ. ඒවා මෙසේය.

I. "ස්වභාව ධර්ම නීතියට විරුද්ධ නොවී සාමකාමීව රට පාලනය කළ එකම පුද්ගලයා සමහර විට සුන් අධිරාජයා විය හැකිය" (*ලුන්යු 1999*: 15:5).

II. "මහාත්මයෙකු ගම්භීර මෙන් ම නිශ්චල විය යුතුය. එහෙත් ඔහු කලහකාරී හෝ තරගකාරී නොවිය යුතුය" (*ලුන්යු 1999*: 15:22).

III. "කාරුණික මිනිසා අනිවාර්යයෙන්ම ධෛර්ය සම්පන්නය" (*ලුන්යු 1999*: 14:4).

IV. "සද්ගුණයට ප්‍රතිවිරුද්ධව සැළකීම ගැන ඔබ මොනවද හිතන්නේ?" (*ලුන්යු* 1999 : 14:34).

V. "පැරණි සංස්කෘතියට මම ඉතාමත් ආශා කරමි. එසේම එය තදින් විශ්වාස කරමි, එය කොතරම්ද කිවහොත් මම ලාඕස සමග මමම සන්සන්දනය කර ගනිමි" (*ලුන්යු 1999*: 7:1).

ලාඕසගේ දාඕදජින්ග් ග්‍රන්ථයේ ඊට සමාන තැන් මෙසේය.

I. ස්වභාවධර්මයට ඉඩ හැර ඊට විරුද්ධව කිසිදු ක්‍රියාවක් නොකිරීමේ ධර්මතාව (*දාඕද ජින්ග්*: 1985: 48 ගීය).

II. දාඕ ශාන්තුවරයා අනුන් සඳහා ක්‍රියා කරන්නේය එහෙත් ඔවුන් සමඟ තරගයට නොයන්නේය (*දාඕදජින්ග්*: 1985: 77 ගීය).

III. කාරුණිකත්වයෙන් කෙනෙක් ධෛර්යසම්පන්න වන්නේය (*දාඕදජින්ග්*: 1985: 67 ගීය).

IV. අයහපතට යහපත (හරවා) යවන්න (*දාඕදජින්ග්*: 1985: 79 ගීය).

ලාඕසගේ ඉගැන්වීම් කොන්ෆියුසියස්ට බලපෑවා ද නැතහොත් කොන්ෆියුසියස්ගේ ඉගැන්වීම් ලාඕසට බලපෑවා ද යන්න චීන විචාරකයන් අතර මතභේදයට තුඩු දුන් කරුණකි. ඊට බලපෑ ප්‍රධානම සාධකය වශයෙන් දැක්විය හැක්කේ මේ දෙදෙනාගේම ග්‍රන්ථවල එන සමාන තැන් විය හැකිය. මේ සාම්‍යයට හේතුව එක්කෙනෙක් අනෙක් පුද්ගලයාට බලපෑවේ යැයි සිතනවාට වඩා සමහර විට

මෙම ආචාර්යවරු දෙදෙනාම තමන්ට පෙර පැවැති සාම්ප්‍රදායික චීන දර්ශනයේ ආභාසය ලැබීම විය හැකිය. මොවුන්ට පෙර චීන ඉතිහාසයේ ගුරු කුල කීපයක් පැවතුනි. ඒවා ඒකරාශී කොට ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීම කොන්ෆියුසියස් අතින් සිදු විය. ඒ බව එතුමාම තම *ලුන්යු* (*Lunyu*) නම් ග්‍රන්ථයේ තමන් සාම්ප්‍රදායික සම්භාව්‍ය චීන ඉගැන්වීම්වල නිර්මාතෘවරයෙක් නොව ඒවා ඉදිරිපත් කරන්නෙක් පමණක් බව ප්‍රකාශ කරයි (a transmitter not an originator). ලාඕස යනු ද සාම්ප්‍රදායික චීන දර්ශනයේ ආ 'දාඕ' හා 'ද' යන ඉගැන්වීම් පදනම් කරගෙන නව ක්‍රමයකට කරුණු ඉදිරිපත් කරන්නෙකි. මේ නිසා මේ දෙදෙනාගේ ම කෘතිවල එකී සාම්ප්‍රදායික කරුණුවල යම් යම් තුලනාත්මක තැන් විද්‍යමාන වීම අරුමයක් නොවේ. එසේම කොන්ෆියුසියස්ට ලාඕසගේ ඉගැන්වීම් බලපෑ බවට කල්පනා කිරීමට තවත් එක් සාධකයක් වශයෙන් ලාඕසතුමා කොන්ෆියුසියස්ට වඩා වයසින් වසර 20-30 පමණ වැඩිමහල් සේ පිළිගැනීම ද දැක්විය හැකිය. රෙන්ජියු නම් වියතා තම ඓතිහාසික පර්යේෂණ මගින් දක්වන්නේ ලාඕසතුමා දළ වශයෙන් ක්‍රි.පූ 580 පමණ එනම් චෝ රාජ්‍ය සමයේ 6 වන ජින්ග් රජතුමාගේ කාලයේ උපන් බවත්, එම රජතුමාගේ 20 වන රාජ්‍ය වර්ෂයේ දී එනම් ක්‍රි.පූ 500 දී මිය ගිය බවත් ය. මීට අමතර ව තවත් විචාරක මත රාශියක් තිබේ. කොන්ෆියුසියස්තුමා අයත් කෙරෙන්නේ ක්‍රි.පූ. 551-479 අතර කාලයට ය.

## *දාඕදජින්ග්* (*Dao De Jing*) ග්‍රන්ථය

ඉහත සඳහන් කළ පරිදි ගුවන් ඉ විසින් කරන ලද ඉල්ලීමකට අනුව ලාඕස විසින් තම මතවාද ඉදිරිපත් කරන ලද ග්‍රන්ථය *දාඕදජින්ග* ය. කොටස් දෙකකින් යුක්ත එය චීන වචන ඡන්දාහකට අධික ය. එය පරිච්ඡේද හෙවත් ගීතමය කොටස් 81 කින් සමන්විතය. එය මුලින් උන පතුරුවල ලියන ලදී. මෙම ග්‍රන්ථයේ ස්වරූපය හා කර්තෘත්වය සම්බන්ධ මත විවිධ ය. ඒ අතර එක් අදහසක් නම් ලාඕස විසින් චීන ඉතිහාසයේ වසන්ත හා සරත් වකවානුයේ පශ්චාත් සමයේ දී එය රචනා කරන ලද අතර යුද්ධ රාජ්‍ය සමයේ විසූ දත් විසින් ඒවා එක්රැස් කොට ග්‍රන්ථයක් වශයෙන් සම්පාදනය කරන ලද බවයි. (සමහරු මෙම දත් ලාඕස වශයෙන් ද හඳුනා ගනිති.) එසේම ලාඕසගේ මෙම ග්‍රන්ථයට පදනම් වී තිබෙන්නේ චීන සම්භාව්‍ය ග්‍රන්ථවලින් උද්ධෘත බව තවත් එක් මතයකි. එම ග්‍රන්ථ වශයෙන් ***ෂුවන්ස, ලූසු ජුන් චියෝ, හන්ෆෙයි ස, ඊවෙන්ස*** යනාදිය දැක්වේ. මෑතකාලීනව ලාඕස ගැන පර්යේෂණය කළ බොහෝ විද්වත්හු වැදගත් මත රාශියක් ඉදිරිපත් කරති. ඒවා සමහරක් මෙසේ ය.

I. *දාඕදජින්ග්* ග්‍රන්ථය නෛසර්ගික ආකෘතියකින් හා ස්වායත්ත තර්ක ක්‍රමයකින් සමන්විතය. එම නිසා එය විවිධ මූලාශ්‍රයවලින් උපුටා ගත් හුදු ප්‍රකාශනවලින් පමණක් සැදුම් ලද්දක්ම නොවේ.

II. ලාඕස ආචාර්යවරයා ඉතිහාසඥ දත් නොවේ. ඊට හේතුව *දාඕදජින්ග්* ග්‍රන්ථය පශ්චාත් වසන්ත හා සරත් කාලයට අයත් වීමය. එහි එන පාරිභාෂික වචන, එළිසම රටාව හා ප්‍රකාශන කීපයක් යුද්ධ රාජ්‍ය

සමය තෙක් භාවිත නොවී තිබීමයි. දස දහසක් රථ වැනි ප්‍රකාශන උදාහරණ වේ. (ten thousand chariots)

III. *දාඕදජින්ග්* ග්‍රන්ථයේ රචනා ශෛලිය, දාර්ශනික දේශනාමය අංග ලක්ෂණ අන්තර්ගත කාව්‍යමය ග්‍රන්ථයක් වූ කොන්ෆියුසියස් විසින් සම්පාදිත යැයි තහවුරු නොවුනත් එසේ පිළිගන්නා *ශජින්ග් (Shi Jing = The Book of Poetry)* ග්‍රන්ථය හා සම්බන්ධයක් උසුලන බව පිළිගැනේ. *දාඕදජින්ග්* ග්‍රන්ථය එම *ශජින්ග්* හිම සංවර්ධනය වීමක් වශයෙන් සැලකේ.

## දාඕ දහමේ මූලික ඉගැන්වීම් යුගලය

මෙම ග්‍රන්ථයේ ප්‍රධානතම සංකල්ප දෙක නම් 'දාඕ' හා 'ද' යනුයි. 'දාඕ' යනුවෙන් ස්වභාව ධර්මයත් 'ද' යනුවෙන් ස්වභාවධර්මයේ ක්‍රියාකාරිත්වයත් අදහස් කෙරෙන බව සාමාන්‍ය පිළිගැනීමයි. එසේම ස්වභාවධර්මයේ අප්‍රකට අවස්ථාව **'ඌ' (wu) ('දාඕ')** යනුවෙන් ද එහි ප්‍රකට අවස්ථාව **'යෝ' (you)** 'ද' යනුවෙන් ද හඳුනා ගැනේ. 'දාඕ' හා 'ද' අතර සම්බන්ධය ඉතාමත් දැඩිය. එය ගඟක හෝ ඇලක ජලය හා පොදුවේ ජලය අතර සම්බන්ධයට සමාන සේ දක්වේ. එසේම 'දාඕ' හා 'ද' එකම කාසියක දෙපැත්තක් බඳුය. 'දාඕ' විසින් දේවල් නිෂ්පාදනය කරන ලද අතර 'ද' විසින් ඒවා පවත්වාගෙන යනු ලබන බව දක්වේ.

> *" 'දාඕ' සියල්ල උපදවයි. 'ද' ඒවා පෝෂණය කරයි. මූල ද්‍රව්‍ය ඒවාට භෞතිකත්වය ලබා දෙයි. පරිසරය ඒවා අංග සම්පූර්ණ කරයි. එම නිසා සියල්ලෝම 'දාඕ' ට වන්දනා කරති. 'ද ' ට ගෞරව කරති."* (*දාඕදජින්ග්* 1985: 51 ගීය).

ලාඕසට අනුව 'දාඕ' සහ 'ද' විශ්වයේ සැම තැනම පවතින අතර ඒවා ක්‍රියාත්මක ය. ඒ අනුව මෙම සංකල්ප හුදු මිථ්‍යා ප්‍රබන්ධ නොව ඒවා තාර්කික වූත් සත්‍ය වූත් ප්‍රායෝගික ඉගැන්වීම් වශයෙන් පිළිගැනේ. ඒ අනුව ඒවා විශේෂයෙන්ම 'දාඕ' දේවවාදී ආගම්වල ලෝක නිර්මාපක සර්වබලධාරී දෙවියන්ට වඩා වෙනස් වේ. තවත් සරලව ප්‍රකාශ කරන්නේ නම් 'දාඕ' යනු අධිභෞතික සත්තාවක් නොව සක්‍රිය සත්‍යයකි. එය අදෘශ්‍යමාන ලෙස (යත) හැඳින්වෙන්නේ එය සත්‍ය වශයෙන් නොමැති නිසා නොව එහි ආකාරයක් ස්වරූපයක් දැක්විය නොහැකි නිසා ය. එය ස්වරූපගත වූ විට ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය. දෘශ්‍යමාන කර ගත හැකි ය. එය අප ඉන්ද්‍රිය ඥානයට හසු කර ගත හැක්කේ 'ද' මගිනි. ඉහත පද්‍යයට අනුව ලොව මුලින්ම පවතින 'දාඕ' ලොව සියලු සත්තාවන්හි විභව ශක්තිය වේ. ඒ සියල්ල පෝෂණය කරනු ලබන්නේ 'ද' ය. එය ද්‍රව්‍ය, පරිසරය, මිහිරි තුෂාර යනාදිය මගින් නිරීක්ෂණය කළ හැකිය. මේ දෙක තුළම දැකිය හැකි සුවිශේෂී ලක්ෂණය නම් සියල්ල ස්වභාවධර්මානුකූලව ඉබේ සිද්ධ වීමට ඉඩ හැරීමයි. කිසිදු ආත්මාර්ථකාමී පෞද්ගලික පරමාර්ථයකින් තොරව, ස්වභාවධර්ම නීතියට අනුව බලපෑමකින් තොරව සියල්ල උපදවන අතර ඒවා අල්පමාත්‍ර වූ ලාභ ප්‍රයෝග අපේක්ෂාවකින් තොරවම ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම මේ දෙක ('දාඕ' හා 'ද') තුළින් සිද්ධ වේ. එහෙයින් 'දාඕ' සියලුම දෙනා

විසින් පූජනීයත්වයෙන් සලකන ලද අතර 'ද' මහත් ගෞරවයකින් සලකනු ලැබේ. මෙම විග්‍රහයට අනුව 'දාඕ' හා 'ද' යනු ස්වභාවධර්මයේම පැතිකඩ දෙකක් වශයෙන් හඳුනාගත හැකි ය. පළමුවැන්න ස්වභාවධර්මයේ උත්පාදක ශක්තියත් දෙවැන්න ස්වභාවධර්මයේ භව්‍ය ලක්ෂණය හා වර්ධනීය ශක්තිය පිළිබිඹු කෙරෙන බව සිතිය හැකි ය.

## 'දාඕ' (Dao)

ලෝකයේ සත්‍ය පිළිබඳ ගවේෂණය සෑම ආගමික හා දාර්ශනික ගුරු කුලයකම අවධානයට ලක් වූ කාරණයකි. සත්‍ය පිළිබඳ ඒ ඒ දාර්ශනිකයන් විසින් බලන දෘෂ්ටිකෝණය එකිනෙකට සමාන නොවේ. මේ නිසා බිහි වන්නා වූ මතවාද හා විමර්ශන බොහෝය. ඒ මතවාද හා දර්ශනයන් ප්‍රභවය ලැබීමට ඒ ඒ චින්තකයන් ජීවත් වූ කාලය, පරිසරය, සමාජ වටපිටාව හා ඔවුන් ලැබූ අධ්‍යාපනය යනාදී විවිධ කාරණා හේතුභූත වන්නට ඇතැයි කල්පනා කළ හැකිය. ඒ සියල්ලම විඥානවාද හා භෞතිකවාද වශයෙන් ප්‍රධාන ප්‍රවාහයන් දෙකකට බෙදා වෙන් කර ගත හැකිය. සත්‍ය විමර්ශනය කරන දාර්ශනිකයන් ප්‍රධාන භූමිකා දෙකකට වෙන් කළ හැකි බව විලියම්ස් ජේම්ස් මහතා ද පවසයි.

> *"දාර්ශනිකයන්ගේ ස්වභාවය අනුව කොටස් දෙකකට ඔවුන් වර්ග කළ හැකිය. එනම් දැඩි සිතක් ඇත්තෝ හා මෘදු සිතක් ඇත්තෝ වශයෙනි. (Tough-minded Philosophers and Tender minded Philosophers) දැඩි සිතක් ඇති දාර්ශනිකයෝ මනස ද්‍රව්‍යයට අඩු කරති. උසස් බව පහත් කරති. ඔවුන්ට අනුව ලෝකය භෞතිකයි. දෙවියන් නැත. මෘදු මනසක් ඇති දාර්ශනිකයෝ ද්‍රව්‍යය මනසට අඩු කරති. පහත් බව උසස් බවට වැඩි කරති. ඔවුන්ට අනුව දෙවියෝ සිටිති"* ( Feng you-Lan 1998: 5-6).

මෙම මෘදු සිතක් ඇති දාර්ශනිකයන්ගේ කණ්ඩායම නැවතත් ඔවුන්ගේ ස්වභාවය අනුව කොටස් දෙකකට වෙන් කර ගත හැකිය. එනම්

I. සර්ව බලධාරී දෙවියෙකුට සියල්ල ආරෝපණය කොට ඒ තුළින් සියල්ල විසඳා ගැනීමට උත්සාහ දරන අය හා

II. යම්කිසි සංකල්පයකට සියල්ල ආරෝපණය කොට ඒ තුළින් සියල්ල විසඳා ගැනීමට උත්සාහ දරන අය වශයෙනි.

සත්‍ය ගවේෂණයේ දී චීනයේ 'දාඕ' දර්ශනය අනුගමනය කර තිබෙන්නේ සංකල්පයක් මගින් සත්‍ය පරීක්ෂා කිරීමයි. එම සංකල්පය 'දාඕ' නමින් ඉදිරිපත් කර තිබේ. 'දාඕ' යන්නෙහි සාමාන්‍යාර්ථය "පාර" (road) "මාර්ගය" (way) "මාවත" යනුයි. නමුත් එහි දාර්ශනික අර්ථය මීට වඩා ගැඹුරු හා පළල් පරාසයක විහිදී පවතී. එය පැහැදිලි කිරීම සඳහා 'දාඕ' දහමේ නිර්මාතෘවර ලාඕස නම් ආචාර්යවරයා විසින් ලියන ලද දාර්ශනික ග්‍රන්ථය *දාඕදජින්ග්* වේ. එම ග්‍රන්ථයේ හතරවන (4) පද්‍යයෙන් 'දාඕ' යනු දෙවියන්ටත් වඩා එහාට ගිය සංකල්පයක් බව ප්‍රකාශ කර තිබේ.

*" 'දාඕ' යනු (ආකාර) ශුන්‍යත්වයයි. එහි ප්‍රයෝජනවත් බව කිසිදා නොසිඳේ. සමහර විට එය හැම දේකම පූර්වාචාර්යවරයා වේ. එය අදෘෂ්‍යමාන, ආකාර රහිත, අභූත තත්ත්වයක් ලෙස විද්‍යමාන වූවත් එය සත්‍ය වශයෙන්ම පවතින්නකි. එය කාගේ ළදරුවෙක් දැයි නොදනිමි. එය දෙවියන්ටත් වඩා එහාට ගිය තත්ත්වයක් සේ පෙනේ" (දාඕදජින්ග්* 1985: 4 වන ගීය*).*

*දාඕදජින්ග්* ග්‍රන්ථයේ ඉදිරිපත් කෙරෙන මේ අදහස පිළිබඳ අගනා විවරණයක් ඉදිරිපත් කරන රෙන් ජි යූ (Ren Ji yu) (1993: 5) නම් චීන විචාරකයා ලාඕස ආචාර්යවරයාට අවශ්‍ය වූයේ චීන සාම්ප්‍රදායික දේවවාදී ආගම්වල අධිකාරය සිඳ බිඳ දැමීමට බවත් ඒ සඳහා ලාඕස විසින් මෙම 'දාඕ' නම් සංකල්පය නව ආරකින් ඉදිරිපත් කළ බවත් පවසයි. (Ren Ji Yu 1993: 5) 'දාඕ' සංකල්පය තුළින් ලාඕස නම් ආචාර්යවරයා සත්‍ය ලෙසම අදහස් කළේ කුමක්ද? කියා විමසීමේදී ඔහු විසින් ලියන ලද *දාඕදජින්ග්* නිබන්ධයේ මුල්ම ගීය (පරිච්ඡේදය) විමසීම ඉතා වැදගත් වේ. එමගින් ඍජුවම විශ්වයේ උපත 'දා ඕ' තුළින් නිර්මාණය වන බව දක්වා තිබුණත් ඉන් ඉස්මතු කරන අර්ථය ඉතා ගැඹුරුය පළල්ය (*දාඕදජින්ග්* 1985: 1වන ගීය).

'දාඕ' යන්න සාමාන්‍ය කථා කරන භාෂාවෙන් ප්‍රකාශ කළ හැකිය එහෙත් එය සාමාන්‍යාර්ථයෙන් 'දාඕ' නම් නොවේ. නාමකරණයෙන් ද එය විස්තර කළ හැකිය. එහෙත් එය සාමාන්‍ය නාමයක් නොවේ. ආකාර රහිත අවාච්‍ය වූ (නම් දිය නොහැකි) තත්ත්වයෙන් දිව්‍යලෝකය හා පොළව ආරම්භ වූයේය. ආකාර සහිත වාච්‍යතාවයෙන් සියලු ලෝකයේ ආරම්භ වේ. ආකාර රහිත භාවයෙහි සියුම් බව හා ආකාර සහිත භාවයෙහි හෝඩුවාව පරීක්ෂා කළ හැකිය. මේ 'දාඕ' වලින් හටගත් 'දාඕ' හිම වෙනස් ආකාර දෙකකි. ආකාර සහිත භාවයේ ගාම්භීරත්වයෙන් ආකාර රහිත භාවයේ ගාම්භීරත්වයට පැමිණිය හැකි ය. ලොව සියලුම දේශයන්හි ම ඒකායන ආරම්භක හේතුව 'දාඕ' නම් වේ. මූලික වශයෙන් 'දාඕ' හි අර්ථ අටක් විද්‍යමාන බව පෙන්වා දිය හැකි ය.

I. විශ්වයේ 'දාඕ'
II. ද්වන්ධ තර්කයේ 'දාඕ'
III. මානව ජීවිතයේ 'දාඕ'
IV. දිව්‍ය ලෝකයේ හා මිනිසාගේ 'දාඕ'
V. පුද්ගල සදාචාරයේ 'දාඕ'
VI. පාලනය කිරීම පිළිබඳ 'දාඕ'
VII. යුද්ධය පිළිබඳ 'දාඕ'
VIII. සාමයේ 'දාඕ'

මෙහිදී අප අවධානය යොමු කරන්නේ විශ්වය පිළිබඳ 'දාඕ' යන මුල් ම අංශය කෙරෙහි පමණක් බව සැළකිය යුතුය. විශ්වයේ උපත පිළිබඳ සත්‍ය බොහෝ ආගමික හා දාර්ශනික චින්තාවන්හි සාකච්ඡා කළ එක්තරා විධියක අධිභෞතික

ගැටලුවක් බව පෙන්වා දිය හැකිය. භෞතික සාධක විමර්ශනය කර භෞතිකමය පිළිතුරු කෙතරම් සැපයුවත් භෞතිකත්වය ඉක්ම වූ යථාර්ථයක් පිළිබඳ කුතුහලය මිනිසා තුළ මෙබඳු 'දාඕ' වැනි දාර්ශනික හා ආගමික සංකල්ප බිහි කිරීමට සමත් වී ඇත. විශ්වයේ 'දාඕ' යනුවෙන් ලාඕස නම් 'දාඕ' නිර්මාතෘවරයා සාකච්ඡා කරන්නේ කුමක්ද? යන ගැටලුව එතුමාගේ අභාවයෙන් පසු පසුකාලීන අනුගාමිකයන් තුළ ද්වන්ධාකාරයක මත පළ කරන්නට ඉවහල් විය. එනම්:

I. 'දාඕ' යනුවෙන් අදහස් කළේ නාස්තිත්වයෙන් ආස්තිත්වය හටගත් බව කීමයි. නැතහොත් නාස්තිත්වය ලොව ආරම්භය වශයෙන් දැක්වීමයි (wu).

II. 'දාඕ' යනුවෙන් අදහස් කළේ ලොව ආරම්භය නාස්තිත්වයක් නොව ආස්තිත්වයක්ම (you) විය යුතු වන අතර ලාඕස අදහස් කළේ එය දැනගත නොහැකි බව පමණි.

විශ්වයේ මූලාරම්භක හුදු නාස්තිත්වයකින් හෝ සඵ ශූන්‍යත්වයකින් ආරම්භ වූයේ යැයි කල්පනා කිරීම චීන චින්තනයට ආධුනික වූවක් නොවේ. පැරණි චීන දාර්ශනික ඉගැන්වීම් තුළ මේ මතයන් සාකච්ඡා වී තිබුණි. විශේෂයෙන් ම *ෂෞයි* (*Zhou yi*) (1993: 311) නම් ඉපැරණි ග්‍රන්ථයේ මෙබඳු සඳහන් විද්‍යමාන වේ.

වන්ග් මින්ග් (Wang ming) (1984: 15) නම් චීන කතෘතුමා තම ග්‍රන්ථයේ ප්‍රකාශ කළේ සම්පූර්ණයෙන් හිස් භාවයක් මුලින්ම පැවති බවත් (ශූන්‍ය) එම හිස් තත්ත්වයෙන් ලොව සියල්ල නිර්මාණය වූ බවත්ය. එසේ නමුත් ලාඕස නම් ආචාර්යවරයා 'දාඕ' යනුවෙන් අදහස් කළේ ලොව ආරම්භය හුදු, හිස්, ශූන්‍ය උච්ඡේද ස්වභාවයකින් සිදු වූ බව ප්‍රකාශ කිරීමක් නොව හුදෙක් එය ආස්තික තත්වයක් බව බොහෝ විචාරකයින්ගේ අදහසයි. එය සත්‍ය වශයෙන් ම පවත්නා න්‍යායක් වුවත් ඊට ආකාරයක් නාමයක් දැක්විය නොහැක. *දාඕදජින්ග්* ග්‍රන්ථයේ මුල් ම ගීයෙන් මේ අදහස් ඉතා පැහැදිලිව දක්වා තිබෙන අයුරු ඉහතින් දක්විණි. එහෙත් එම ග්‍රන්ථයේ 21 වන ගීය ඊට සම්පූර්ණයෙන්ම වෙනස් අදහස් ඉදිරිපත් කර තිබේ. *දාඕදජින්ග්* 21 වන ගීයෙන් ප්‍රකාශ කෙරෙන්නේ 'දාඕ' යනු ගැඹුරු සියුම් තත්ත්වයක් වුවත් එහි ආකාරයක් ද්‍රව්‍යයක් සාරයක් ඇති බවයි.

වන්ග් කේ පින්ග් මහාචාර්යතුමා මේ අදහස ඉතා මැනවින් මෙසේ ප්‍රකාශ කරයි.

> *"අසද් - නැති තත්වය යනු හුදු හිස් ශූන්‍යත්වය නොවේ. එය ඇත්තටම සත්‍ය වූ පවතින තත්ත්වයකි. නමුත් එහි ආකාරයක් නැත. ඒ නිසා එය අපැහැදිලිය. මතකයට නැගීම අපහසුය"* (Wang ke Ping 1998: 2).

ජන්ග් ගු ඉන්ග් හා බයිෂි (2001 : 117) යන දෙදෙනා විසින් රචනා කරන ලද ලාඕස අපදානයේ 'දාඕ' යනු සත්‍ය වශයෙන් පවතින යථාර්ථවත් ස්වාධීන තත්ත්වයක් බව දක්වා තිබේ. ලාඕස 'දාඕ' නම් සංකල්පයෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ දරන්නේ කුමන ආකාර මතවාදයක්ද යන්න රෙන්ග් ෂී යු මහතා මෙසේ සංක්ෂිප්ත කොට දක්වා තිබේ.

> *"ලාඕසතුමා දාඕ සංකල්පය එක්තරා දුරකට විග්‍රහ කළත් එහි නියම ලක්ෂණ හරියටම විස්තර කිරීමට අපොහොසත් වූයේය. ඊට හේතුව එම විවරණයන් පදනම් වී තිබෙන්නේ ආකාර රහිත (Formaless) ශූන්‍ය (nothing) ස්වරූප විරහිත (shapless) යනාදි නාස්ත්‍යාර්ථවත් පදයන්ටය. චීන දාර්ශනික ඉතිහාසයේ ලොව සැම දෙයකම මූලය වශයෙන් ඉගැන්වෙන මෙම නාස්තිත්වය (හිස් බව) ඥානය පිළිබඳ වර්ධනීය අවස්ථාවකි. එය ආකාර රහිත හෝ ප්‍රතිරූප රහිත තත්වයකට පශ්චාත්ගාමී වේ. මෙය ආකාර රහිත ආකාරය, ප්‍රතිරූප රහිත ප්‍රතිරූපය නම් වේ "* (Ren Ji yu 1993: 5).

මේ විවරණයට අනුව සාම්ප්‍රදායික චීන දර්ශනයේ ලොව හටගැනීම නැති තත්ත්වයකින් (අසද්) සිදු වූ බවත් එම නැති තත්ත්වයට නව සද් අර්ථයක් (possitive) ලාඕස විසින් තම *දාඕදජින්ග්* ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර ඇති බවත් පැහැදිලිය. 'දාඕ' යනු නැති හිස් ශූන්‍ය තත්ත්වයක් වශයෙන් සාවද්‍ය ලෙස අවබෝධ කර ගැනීමට බොහෝ දෙනා පෙළඹෙන්නේ එය හැඳින්වීම සඳහා යොදා ඇති නිශේධාර්ථවත් පද නිසාය. උදාහරණ වශයෙන් 'ඌමින්ග්' (නමක් දිය නොහැක) (Wu ming) 'ඌ ෂින්ග්' (Wu xing) ආකාර රහිත යන පද දැක්විය හැකිය. කෙසේ නමුත් බහුතර චීන විචාරකයන්ගේ මතය වන්නේ 'දාඕ' යනු සත්‍ය ලෙසම වර්තමාන යථාර්ථයක් බවයි. 'දාඕ' හා ස්වභාව ධර්මය අනන්‍ය වශයෙන් ගෙන කළ ප්‍රකාශයන් ද *දාඕදජින්ග්* ග්‍රන්ථයේ දක්නට ලැබේ. ලාඕස නම් ආචාර්යවරයාට අවශ්‍ය වූයේ දෙවියෙක් හෝ සංකල්පයක් තුළින් ලොව විමර්ශනය කරනවාට වඩා ස්වභාවධර්මය තේරුම් ගැනීම බවත් එම ස්වභාවධර්මය හා එහි ක්‍රියාවලින් මෙම 'දාඕ' යන පදයෙන් පෙන්වා දීමට බවත්ය. 'දාඕ' යනු ස්වභාව ධර්මය වශයෙන් ඉදිරිපත් කළ අවස්ථා රාශියක් පෙන්වා දිය හැකිය. *දාඕදජින්ග්* 25 වන ගීය (පරිච්ඡේදය).

> *"දිව්‍ය ලෝකය හා පොළව යන දෙක හට ගැනීමට පෙර සියල්ල ඒකරාශී වූ නොබෙදෙන ලද යමක් වී ද එය ශබ්ද රහිතය. ආකාර රහිතය. ස්වාධීන පැවතුම් ඇත්තේය. සදාකල්හිම වෙනස් නොවේ. දිව්‍ය ලෝකයේ හා පොළවේ මාතාව වශයෙන් සැළකිය හැකිය. මම එහි නාමය නොදනිමි. එම නිසා එයට 'දාඕ' (Dao) යැයි කියනු ලැබේ. එයට වෙනත් නාමයක් දීමට මට බල කර සිටී නම් මම එය ශ්‍රේෂ්ඨත්වය (The Great) යනුවෙන් නම් කරමි. මේ ශ්‍රේෂ්ඨත්වය අසීමිතය. සියලු දිශාවන්හි සක්‍රීයය. එහෙයින් එය ඉතා දුරස්තය. එහෙයින් එය තම මූල ස්වභාවය වෙත යන්නේය. එම නිසා 'දාඕ' ශ්‍රේෂ්ඨත්වය, දිව්‍ය ශ්‍රේෂඨත්වය, පෘථිවි ශ්‍රේෂ්ඨත්වය හා මනුෂ්‍ය ශ්‍රේෂ්ඨත්වය වශයෙන් කිව යුතුය. විශ්වයේ ශ්‍රේෂ්ඨත්ව හතරින් මනුෂ්‍යා යනු ද එක් ශ්‍රේෂ්ඨත්වයකි. මිනිසා පෘථිවි මාර්ගය අනුගමනය කරයි. දිව්‍යත්වය 'දාඕ' මාර්ගය අනුගමනය කරයි. 'දාඕ' ඔහුගේ මුල් ස්වරූපයයි. එනම් ස්වභාව ධර්මය අනුගමනය කරයි "* (*දාඕදජින්ග්'* 25 වන ගීය).

රෙන් ජී යු මහාචාර්ය තුමා (1993: 4-5) ලාඕසගේ *දාඕදජින්ග්* ග්‍රන්ථයට අනුව 'දාඕ' යන්නෙහි අර්ථ පහක් පෙන්වා දිය හැකි බව පවසයි. ඒ මෙසේය.

I. නොබෙදන ලද මූල තත්ත්වය (The undifferentiated primitive state (chaos)
II. ස්වභාවධර්මයේ චලනය (The motion of nature)
III. ද්‍රව්‍යයන්හි මූල ස්වරූපය (Tao is the proto-material)
IV. මනුෂ්‍ය ඇසට අදෘෂ්‍යමාන (Tao is invisible to man's eyes)
IV. සියලු දෙයෙහි නීතිය (Tao means the Law of things)

මෙම පංච වර්ගී විග්‍රහයන් අතුරින් එකක් වශයෙන් 'දාඕ' හා ස්වභාවධර්මය අතර සම්බන්ධය දක්වා තිබේ. එතුමා එය 'දාඕ' යන්න ස්වභාවධර්මයේ චලනය නැතහොත් ස්වභාවධර්මයේ ක්‍රියාකාරී ස්වරූපය වශයෙන් දක්වා තිබේ.

## "එක" 'දාඕ' ගෙන් ආරම්භ වේ (Dao produces one)

ලොව කිසිවක්ම නැති අවස්ථාවේදී මුල්ම තත්ත්වය හෙවත් එක ප්‍රභවය ලැබුයේ 'දාඕ' ගෙන් බව ඉදිරිපත් කර තිබේ.

> *' 'දාඕ' විසින් "එක" නිර්මාණ කරනු ලැබේ. එක විසින් "දෙක" නිර්මාණය කරනු ලැබේ. "දෙක" විසින් "තුන" නිර්මාණය කරනු ලැබේ. "තුන" විසින් සියලු ලොව නිර්මාණය කරනු ලැබේ."* (*දාඕ ද ජින්ග්* 1985: 42 වන ගීය)

'දාඕ' දහමට අනුව මේ ලොව එක යනු කුමක්දැයි විමසිය යුතුය. ලොව 'එක' වශයෙන් එහි ඉදිරිපත් කෙරෙන්නේ තැයිජි (Tai Ji ) යන්නයි. මෙහි 'තැයි' යනු ඉතාමත් (The most) යනාර්ථ වේ. 'ජි ' යනු උපරිම, සියුම් (extream) යනාර්ථයයි. ඒ අනුව 'තැයිජි' යනු ද්‍රව්‍යයන්ගේ ඉතාමත් සියුම් අවස්ථාව වශයෙන් පෙන්වා දිය හැකිය. ද්‍රව්‍යයන් විශ්ලේෂණය කිරීමේදී කළ හැකි උපරිම අවස්ථාව මෙමගින් අවධාරණය කෙරේ. එසේම එය පරමාණු වශයෙන්ද ('atom – yuan zi ÿ මූල ද්‍රව්‍ය (elements-yuan qi) වශයෙන්ද එක්තරා දුරකට දැක්විය හැකිය. සාම්ප්‍රදායික චීන දර්ශනයෙ 'චී' ('qi) යන්නෙහි අර්ථ දෙකක් ඇත. එනම්

I. මූල ද්‍රව්‍ය (Substance)
II. ද්‍රව්‍යයන්හි බලය (Material force)

සාම්ප්‍රදායික චීන දර්ශනයේ ලොව හට ගැනීම මූල ද්‍රව්‍ය පහකින් සිදු වූ බව කියැවේ. ඒවා 'ඌ ශින්ග්' (Wu Jing) නමින් හැඳින්වේ. ඒවා මෙසේය.

I. ජලය (water)
II. ගින්න (fire)
III. දැව (wood)
IV. යකඩ (metal)
V. පස (earth)

*ලාඕසඅපදාන* නම් ග්‍රන්ථයේ 'දාඕ' හා 'තැයි ජි' යනු දෙකක් නොව එකක්ම වශයෙන් දක්වා තිබේ. එය දෙකක් වශයෙන් දක්වා තිබෙන්නේ සත්‍ය ලෙසම දෙකක් වන නිසා නොව ලිවීමේ ආකාරයක් වශයෙන් පමණක් බව තවදුරටත් ප්‍රකාශ කරයි. (Chen Guying and Bai Xi 2001: 117). ලියො පන්ග් (Liu Peng) (1998: 26) පෙන්වා දෙන පරිදි 'චී' (qi) මූල ද්‍රව්‍යයන්ට වඩා ලොව වැදගත් වන්නේ 'දාඕ' ය. 'දාඕ' යනු ලොව සියලුම වෙනස්කම් හා සංවර්ධනයන්හි මූලය බවත් ඔහු තවදුරටත් පෙන්වා දෙයි. මූල ද්‍රව්‍ය (චී) පවා වෙනස් වන්නේ 'දාඕ' නීතියට අනුව බව කියන එතුමා ඒ අනුව මූලද්‍රව්‍ය යනු ලොව සියලු දේවලින්ම මූලික ද්‍රව්‍ය වන අතර (basic substance) 'දාඕ' යනු ලොව සියලු වෙනස්කම් මෙහෙයවන නීතිය, ප්‍රතිපත්තිය වශයෙන් තවදුරටත් පෙන්වා දෙයි.

## "එක" විසින් දෙක ප්‍රභවය කෙරේ (One Produces Two)

මෙහි ලොව එක වන 'තැයි ජි' විසින් ලොව දෙක වන 'ඉන් හා යන්ග් ' (yin-yang) නිෂ්පාදනය කරනු ලැබේ. 'ඉන් හා යන්ග් ' යනු ලොව පවත්නා ද්විත්ව ස්වභාවයයි. එනම් ස්ත්‍රි-පුරුෂ, ඉර-හඳ, කලු-සුදු, උඩ-යට යනාදී ලොව පවත්නා උභයාර්ථවත් ස්වරූපයයි. එනම් අසමාන ද්‍රව්‍යවල ආවශ්‍යක සම්බන්ධතාවයි. (gui lu) එම ද්‍රව්‍යයන් එකක් වශයෙන් ස්වභාව ධර්මයේ පවත්නා විට එයට 'චී' (qi) හෙවත් මූලද්‍රව්‍ය නාමයෙන් හැඳින්විය හැකි වුවත් ඒවා දෙකකට වෙන් වූ අවස්ථාව 'ඉන්' හා 'යන්ග්' වශයෙන් හඳුන්වා දී තිබේ. 'දාඕ' ධර්මයේ විග්‍රහයන්ට අනුව ලෝකයේ ප්‍රභවය සම්බන්ධ ක්‍රියාවලියේ දෙක වශයෙන් ගැනෙන්නේ දිව්‍ය ලෝකය හා පොළවයි (Heaven and earth) දාඕදජින්ග් නම් ග්‍රන්ථයේ ඒ බව මැනවින් ප්‍රකාශ වේ. (දාඕදජින්ග් 1 වන ගීය)

## "දෙක" විසින් "තුන" ප්‍රභවය කෙරේ

මෙහි ඉගැන්වෙන තුන නම් දිව්‍ය (Tian), පෘථිවි (di ), මනුෂ්‍ය (ren-) යනුයි. තුන විසින් සියලු ලෝකය ප්‍රභවය කරනු ලැබේ. මේ අනුව ලෝකයේ ප්‍රභවය පිළිබඳ 'දාඕ' විග්‍රහය එක්තරා ආරෝහණ පටිපාටියකට සැකසී තිබෙන අයුරු පැහැදිලි කරගත හැකි ය. එසේ ම එකක් අනෙකින් ප්‍රභවය ලබන හෙයින් පරිණාමීය ස්වරූපයකට සිදුවන ආකාරය ද මනාව තේරුම් ගත හැකි ය.

ලෝකයේ ආරම්භය හා විකාශනය එක්තරා ක්‍රමබද්ධ වර්ධනීය රටාවකට සිදුවන ආකාරයෙන් ඉදිරිපත් කර තිබුණත් චීන ඉතිහාසයේ වෙයි ජින් (wei Jin) සමයේ වන්ග් බී (Wang bi) නම් 'දාඕ' අටුවාචාර්යවරයා විසින් ඉදිරිපත් කරන ලද ක්‍ෂුවැන් ක්‍ෂුවේ (xuan xue) හෙවත් ගැඹුරු ධර්මය (අභිධර්මය - metaphysics) තුළින් නව අර්ථකථනයක් දීමට හැකි වී තිබේ. වෙයි ජින්ග් ක්‍ෂුවැන් ක්‍ෂුවේ නමින් ප්‍රකට මෙම ඉගැන්වීම් තුළින් මූලික වශයෙන් ඉදිරිපත් කරනු ලැබූයේ 'ඉ උ වෙයි බර්න්' යන දර්ශනයයි. එනම් ලොව සැම දෙයක්ම ආරම්භක වශයෙන් හෝ යථාර්ථ වශයෙන් සද් නොවන බවයි (originally or really non-existence). 'දාඕ' දහමේ ඉගැන්වූ ලොව ආරම්භය පිළිබඳ මුල් දර්ශනය පදනම් කරගෙන වන්ග් බි නම් 'දාඕ' අටුවාචාර්යවරයා මෙබඳු නව දර්ශනයක් ඉදිරිපත් කිරීම 'දාඕ' දහමේ වර්ධනීය අවස්ථාවක් වශයෙන් පෙන්වා දිය හැකිය. එසේම එය එක්තරා විදිහක විශ්ලේෂණාත්මක හා විභජ්ජවාදී විග්‍රහයක්

වශයෙන් ද සඳහන් කළ හැකිය. මේ නිසා මෙම වන්ග් බී ගේ ක්‍රමවේදය මුල් 'දාඕ' ඉගැන්වීම්හි දැක්වුණු ආරෝහන පටිපාටියට වඩා වෙනස් වන බව ද පැවසිය හැකිය.

## 'ද' හෙවත් 'දාඕ' දහමේ සදාචාරය

'දාඕ'ගේම නිෂ්පාදනයක් වූ 'කුංවැන් ද' හෙවත් ගාම්භීර 'ද' (the great virtue) ආශාවන්, ගැටුම්, තරගකාරිත්වයන්, ලාභ අලාභයන් ආදියෙහි පැවැතිය යුතු සියලු ම ලෞකික වටිනාකම් ඉක්මවා ගිය එකකි. මෙම උසස් 'ද' 'දාඕ' ස්වභාවයේ සුවිශේෂී ලක්ෂණයක් වශයෙන් දැක්විය හැකි අතර එය ලාඕස නම් ආචාර්යවරයාගේ දර්ශනයේ ආධ්‍යාත්මික වටිනාකම මූර්තිමත් කරයි. 'දාඕ' දහම පදනම් වී තිබෙන්නේ 'ද' දර්ශනය මතය. මානවයාගේ ගැටලුවලට ව්‍යංගයෙන් හෝ ඍජුවම පිළිතුරු මෙමගින් සපයාගත හැකිය. එසේම වර්තමානයේ පවත්නා සමාජ ගැටලු හා පිළිතුරු විෂයෙහි ලාඕසගේ චින්තනය මෙම 'ද' ඉගැන්වීම තුළින් මූර්තිමත් කෙරේ.

'ද' යන්නෙහි සමාජීය හා ආචාරාත්මක අර්ථය සදාචාරය යන්නයි. සදාචාර පෝෂණය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. උසස් 'ද' වත් පුද්ගලයා අනුගමනය කරන්නේ සියල්ල ස්වභාව ධර්මයට අනුකූලව සිදුවීමට ඉඩ හැරීමය. ඔහු කිසි විටෙකත් තම 'ද' තුළ ව්‍යාජ ප්‍රදර්ශනයන් නොකරයි. එම නිසා ම ඔහු 'ද' පිළිබඳ සවිඥානක ද නොවේ. එහෙත් සත්‍ය වශයෙන්ම ඔහු 'ද' අනුගමනය කරන්නෙක් වේ. ඒ බව *දාඕදජින්ග්* ග්‍රන්ථයේ 38 ගීයේ මෙසේ දැක්වේ. ***"ශන්ග් ද බූ ද ශ ඉ යෝ ද' (shang de bu de shi yi you de......).*** 38 ගීයේ එය තව දුරටත් මෙසේ දැක්වේ. ***"සන්ග් ද ඌ වෙයි අර් ඌ බූ වෙයි" (shang de wu wei er wu bu wei).*** ඉන් ප්‍රකාශ කෙරෙන්නේ උසස් 'ද' වත් පුද්ගලයා (ස්වභාව ධර්මයට විරුද්ධව) කිසිවක් නොකරන අතර ඔහු කරන සියල්ලම අපේක්ෂා විරහිත බවය. එහෙත් පහත් 'ද' වත් පුද්ගලයා එසේ නොවේ. ඔහු 'දාඕ' පිළිබඳ සාටෝපවත් ආකල්පයක් දරයි. එම නිසා ඔහුගේ 'ද' ප්‍රදර්ශනාත්මකය. එහෙයින් ඔහු තම 'ද' වත් භාවය ගැන අවධානයකින් පසුවෙයි. එසේම ඔහු තම ලාභාපේක්ෂාවෙන් සිතා මතා 'ද' අනුගමනය කරයි. ඒ බව *දඕදජින්ග්* ග්‍රන්ථයේ 38 ගීයේ මෙසේ දැක්වේ. ***"ක්‍ෂ්‍යා ද බූ ක්‍ෂියැන් ද, ෂ ඉ උ ද" (xia de bu xian de shi yi wu de......).*** මෙම 38 වන ගීයට අනුව 'ද' වත් භාවයේ උසස් පහත් කියා භේද දෙකක් විද්‍යමාන වන අතර ඉන් පළමුවැන්න තුළ 'අපේක්ෂා විරහිතභාවය' හා 'කිසිවක් නොකිරීම හෙවත් ස්වභාවධර්මයට අනුගත වීම' මෙන්ම දෙවැන්න තුළ 'අපේක්ෂා පූර්ණත්වය' හා ස්වභාවධර්මය නොතකා යම් යම් ප්‍රදර්ශනාත්මක ක්‍රියාවක් කිරීම' යන ලක්ෂණ වැදගත් වේ. ලාඕස නම් ආචාර්යවරයා තම *දාඕදජින්ග්* ග්‍රන්ථය තුළින් උනන්දු කරවන්නේ මෙම උසස් 'ද' අනුගමනය කිරීමටය. එසේම උසස් 'ද' වත් පුද්ගලයා පරමාදර්ශී තැනැත්තෙක් වශයෙන් 'දාඕ' දහමේ හැඳින්වේ. 'ද' සංකල්පය තුළ පවත්නා උසස් පහත් භාවය තව දුරටත් විස්තර කරන 38 වන ගීයේ වටිනා වචන යුගල දෙකක් භාවිත කර තිබේ. එනම් i. මල හා ඵලය ii. ගණත්වය හා කෙට්ටු බව යන දෙක වේ. ලාඕසට අනුව උසස් 'ද' සමාන වන්නේ ඵලයටය. මලට සමාන වන්නේ පහත් 'ද'ය. එසේම ගණත්වය සමාන වන්නේ ද උසස් 'ද' ට ය. පහත් 'ද' ට

කෙසඟත්වය සමාන වේ. මෙම වර්ගීකරණය තුළ විද්‍යමාන අපූර්වත්වය ප්‍රකට වන්නේ පහත් 'ද්'ට අයත් කර තිබෙන අංශ දෙස විමසා බැලීමෙනි. ඒවා නම් මනුෂ්‍යත්වය, ධාර්මිකත්වය හා විනීතභාවය වේ. මෙම ගුණාංග ලාඕසගේ 'දාඕ' දර්ශනයේ උසස් සදාචාරාත්මක ගුණධර්ම හෝ වටිනාකම් වශයෙන් නොදැක්වීම එතුමාගේ ඉගැන්වීම් තුළ තිබෙන සුවිශේෂී කරුණකි. එසේම එබඳු විශ්මයාවහ විග්‍රහයකට පාදක වූ පසුබිම විමර්ශනය කිරීම ලාඕසගේ මෙම අදහස තව දුරටත් පැහැදිලිව අවබෝධ කර ගැනීමට උපස්ථම්භක වේ. ලාඕස මෙමගින් අවධාරණය කරන්නේ එවකට සිටි පාලක පැලැන්තිය විසින් වර්ණනා කරන ලද එමෙන් ම උසස් සේ සළකා අනුගමනය කරන ලද එකල සමාජයේ සදාචාරවත් යැයි සම්මත ගුණධර්ම කීපයකි. එසේම ඒවා මුලින් රූජියා (Rujia) නමින් හැඳින්වූ පසුව කොන්ෆියුසියස් ධර්මය වූ සාම්ප්‍රදායික සම්භාව්‍ය චීන දර්ශනයේ උසස් සදාචාරවත් ලක්ෂණ සේ සැළකූ අංශ ද වේ. මෙකී මනුෂ්‍යත්වය, ධාර්මිකත්වය හා විනීතභාවය යනාදී ගුණධර්ම අනුගමනය කිරීමෙන් එදා සමාජයේ බොහෝ පුද්ගලයන් අපේක්ෂා කළේ ලාභ ප්‍රයෝජන ය. එසේත් නැත්නම් කිසියම් හෝ ඵල ප්‍රයෝජනයකි. ලාඕස එය දකින්නේ 'ද්'ගේ පහත් ස්වරූපයක් අනුගමනය කිරීමක් වශයෙනි. එම නිසා ඒවා සමාන කරන්නේ 'ද්'ගේ මලටය. එසේම 'ද්'ගේ කෘශත්වයටය (කෙට්ටුකම). මෙම 'ද්'ගේ පහත් ස්වරූපය ප්‍රතික්ෂේප කරන ලාඕස උසස් 'ද්' අගය කරයි. උසස් 'ද්' සමාන කරන්නේ 'ද්'ගේ මලට නොව ඵලයටය. ශ්‍රේෂ්ඨ පුද්ගලයා වාසය කරන්නේ 'ද්'ගේ කෘශත්වය තුළ නොව 'ද්'ගේ ඝණත්වය තුළ ය.

මේ අනුව ලාඕසගේ 'ද්' විග්‍රහයට සමකාලීන සමාජයේ පැවැති දේශපාලන හා සමාජ ඇගයීම් හා වටිනාකම් හා සාම්ප්‍රදායික චීන දර්ශනයේ ආ රූජියා (Rujia) සමහර ඉගැන්වීම් පසුබිම් වූ බව පෙන්වාදිය හැකි ය.

'ද්' ගේ ගුණාංග ඒ ඒ ක්ෂේත්‍ර අනුව විවිධය. 'ද්' ගේ ක්‍රියාකාරිත්වයේ බහුවිධ ස්වරූපය ඒ ඒ සන්දර්භයන් තුළ විද්‍යමාන වන අයුරු *දාඕදජින්ග්* ග්‍රන්ථයේ 54 වන ගීයෙන් ප්‍රකාශ වේ. *දාඕදජින්ග්* 54 වන ගීය එහි 'ද්', පුද්ගලයා, පවුල, සමාජය, ජාතිය හා ලෝකය යනාදී අංශ තුළ අත්විඳින විට ඒ ඒ භූමිකාවල සිද්ධ වන සුවිශේෂීතාවන් මෙමගින් ප්‍රකට කෙරේ. යම් පවුලක්, සමාජයක්, ජාතියක්, ලෝකයක් 'ද්' වත් වීම තුළින් සාක්ෂාත් කර ගන්නා ප්‍රතිජානනාත්මක ප්‍රයෝජනයන් මෙමගින් ඉස්මතු කෙරේ. 'ද්' වත් පුද්ගලයෝ කිසි විටෙකත් යමක් ගොඩනැගීමේ දී හා ග්‍රහණය කර ගැනීමේ දී කිසි විටෙකත් පරාජිතයෝ හෝ බලාපොරොත්තු සුන් වූවෝ හෝ අභාග්‍යසම්පන්නයෝ හෝ නොවෙති. ඔවුහු නිරන්තරයෙන් ම සුභවාදී ව ඉදිරියට ම ගමන් කරන්නෝ වෙති. 'ද්' ගේ ගුණාංගයන් විමසීමේ දී *දාඕද ජින්ග්* ග්‍රන්ථයේ 54 ගීය මෙන්ම 55 ගීය ද වැදගත් වේ. 55 ගීයේ 'ද්' ගේ ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීමේ දී එය ආශා විරහිත අහිංසක දරුවෙකුගේ තත්වයට උපමා කර තිබේ. *දාඕදජින්ග්* 55 වන ගීය එබඳු අසරණ දරුවෙක් තමන්ට තිබෙන විසකුරු කෘමීන්ගෙන් වන තර්ජන වැනි දෑ ගැන කිසිවක් නොදන්නා බැවින් නිදහස් සාමකාමී පුද්ගලයෙක් වේ. එලෙසම ආශා විරහිත, විද්‍යාවෙන් තොර අහිංසක දරුවෙකු බඳු වූ පුද්ගලයා 'ද්' ඔහුගේ එම අහිංසකත්වය ආශා විරහිතභාවය හා අඥානකත්වය නිසාම අන් අයට ඊර්ෂ්‍යා කිරීම, ද්වේෂ කිරීම හා අන් අයට භය ඉපදවීම බඳු දුශ් ක්‍රියාවන්ගෙන් තොර වේ. එසේම ඔහු එබඳු අවස්ථාවන්හි බොහෝ දුරට අක්‍රියව සිටියි. මෙම අහිංසක

දරුවා පිළිබඳ උපමාව තුළින් ලාඕස සමාජගත ගැඹුරු දර්ශනයක් නිර්මාණය කිරීමට උත්සාහ දරා ඇත. වැඩිහිටි සමාජයේ හා පුද්ගලයන් තුළ පවතින අධික තෘෂ්ණාව, කෲරත්වය, තරගකාරිත්වය මෙන්ම ඥානවන්ත බව ප්‍රතික්ෂේප කරන 'ලාඕස' අහිංසක දරුවෙකු බඳු වීම යෝජනා කරයි. එබඳු දරුවා ඉහත දක්වූ වැඩිහිටි සමාජයේ දුශ්චරිතවලින් බොහෝ සෙයින් වියුක්තය. එසේම එම දරුවා බොහෝ දුරට ස්වභාව ධර්මයට අනුව නිදහස්ව ජීවත් වන්නෙකි. එබඳු ජීවිතය වඩාත් ඵලදායි බව ලාඕසගේ පිළිගැනීම යි. මේ අදහස ගොඩනැගීමේ දී ද සමකාලීන දේශපාලන හා සමාජ පසුබිම ලාඕස ට බලපාන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. එය තවත් මූර්තිමත් වන්නේ 'තම ශාරීරික ජීවිතය ආරක්ෂා කර ගැනීමට නම් කෙනෙක් බිළිඳකු මෙන් හැසිරීම ඵලදායි වේ' යැයි එතුමා කරන ප්‍රකාශය දෙස විමසිලිමත් වීමෙනි.

ඉහත ඉදිරිපත් කළ ලාඕසගේ දර්ශනය ෆන්ග් යෝ ලන්ග් (Peng You Lan) ඉතා කෙටියෙන් මෙසේ දක්වා තිබේ.

> ''*රජය, නීතිය, සංස්ථා හා සියලුම කෘත්‍රිම දේවල් 'දාඕ' දහමට විරුද්ධය. ඒට හේතුව ඒවා ස්වභාවධර්මය විකෘත කිරීමෙන් තනාගත් අතර සියලු දුක්ඛ දෝමනස්සයන්ට හේතුවීමය. ප්‍රඥාමය දැනුම ද අවඥාවෙන් සැළකේ. ඒට හේතුව එය (සමාජ) ප්‍රභේදයන් ඇති කරන අතර සියල්ලේම පවත්නා ගුප්තභාවය විනාශ කරයි*'' (Peng You Lan 1998: 5-6).

## නිගමනය

ඉහත සාකච්ඡා කළ කරුණු අනුව ලාඕසතුමා ජීවත් වූ ක්‍රි. පූ. සයවන සියවසේ චීනයේ පැවති සමාජ දේශපාලන ආර්ථික හා දාර්ශනික ඉගැන්වීම් ලාඕස තුමා තම 'දාඕ ' දර්ශනය ගොඩ නැගීමේ දී උපස්ථම්භක කර ගත්බවට පෙන්වාදිය හැකි ය. අතීත දැනුම සමකාලීන සමාජ හා දාර්ශනික ඉගැන්වීම් හා අත්දැකීම් පදනම් කරගෙන ඒවා නව ආරයකින් සකස්කොට ඉදිරිපත් කළ බැවින් ලාඕසතුමා චීනයේ මහා දාර්ශනිකයෙකු වශයෙන් ගෞරවයට පත්විය. ලාඕස තුමාට පෙර පැවති සියයක් ගුරුකුල වල ඉගැන්වීම් මෙන් ම එතුමාට සමකාලීන කොන්ෆියුසියස් ඉගැන්වීම් ද මෙහි දී උපයෝගී වූ බව පෙන්වා දිය හැකිය. බුදු දහම චීනයට සම්ප්‍රාප්ත වන්නේ පශ්චාත් කාලීනව බැවින් එය ලාඕසගේ මූලික දර්ශනයට බලපෑමක් කළ බවට සාධක විද්‍යමාන නොවේ. එහෙත් පශ්චාත්කාලීනව දාඕ ආගමේ සංවර්ධනයට බෞද්ධාභාෂය ලැබුණු බව කිව හැකිය. විශේෂයෙන්ම දාඕ අවුවාචාරින්ට බෞද්ධ දර්ශනයේ ආභාෂය ලැබෙන්නට ඇති බව පිළිගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය

* ලකුණ යොදා ඇත්තේ චීන ග්‍රන්ථ ඉදිරිපිට පමණක් බව සළකන්න

ප්‍රාථමික මූලාශ්‍රය

* 'දාඕදජින්ග්' (DaoDeJing) (1985) Renjiyu, shanghai Chinese Classics Publishing House.

* 'ලුන්යු' (Lunyu) (1999) Yan Bojun (පරි) China, Hunan people's Publishing House.

'සොවුයි' (Zhouyi) (1971) Jemes Legge (පරි) NewYork Dover publications,Inc.

ද්විතීයික මූලාශ්‍රය

*Chen Guying, and Bai xi, (2001) *Laoshi Pingchuan*, Nanjing, NanJing Daxue Chubanshi.

Pung you-Lan, (1998) *A Taoist Classic Chuang-Tzu*, Beijing, Foreign Language Press.

Liu peng, (1998) *Taoism as an Indigenous Chinese Religion*, Translated by Lao an, Shang dong Friendship.

Ren Ji yu, (1993) *A Taoist Classic – The Book of Lao zi*, Beijing, Foreign Language Press.

*Wang Ming, (1984) *DaoJia he DaoJiao Si xiang Yang Jiu*, Shanghai, Zhang GueshiHui Kexue Chubanshi.

Wang ke Ping, (1998) *The Classic of the Dao – A New Investigation*, Beijing, Foreign Language Press.